# සමස්ත ලංකා සමෘද්ධි සංවර්ධන (බැංකු සංගම් , මහා සංගම් හා කාර්යාල) නිළධාරී සංගමයේ සුභ සාධන අංශ ව්‍යවස්ථා මාලාව

01 . සමිතියේ නම :-

සමස්ත ලංකා සමෘද්ධි සංවර්ධන (බැංකු සංගම් , මහා සංගම් හා කාර්යාල) නිළධාරී සංගමයේ නිළධාරී සුභ සාදක සංගමය.

02 . ලියාපදිංචි කාර්යාලය :-

සුභ සාධක ලේකම්
සමස්ත ලංකා සමෘද්ධි සංවර්ධන (බැංකු සංගම් , මහා සංගම් හා කාර්යාල) නිළධාරී සංගමය
අංක 68 , දෙහිදෙනිය , පේරාදෙනිය

03 . අරමුණ :- සමස්ත ලංකා සමෘද්ධි සංවර්ධන (බැංකු සංගම් , මහා සංගම් හා කාර්යාල) හා කෙෂ්ත්‍රයේ කටයුතු කරන නිළධාරීන්ගේ ආර්ථික , සමාජීය , සංස්කෘතික සුභ සාධන කටයුතු වැඩි දියුණු කොට පවත්වාගෙන යාම.

04 . පරමාර්ථ :-

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ සමෘද්ධි බැංකු සංගම් , මහා සංගම් , කාර්යාල හා කෙෂ්ත්‍ර ගත රාජකාරීන්හි නියුතු සියලු සමෘද්ධි සංවර්ධන නිළධාරීන් සමිතිය යටතේ මැනවින් සංවිධාන ගත කිරීම.

සාමාජිකයාගේ සහ යැපෙන්නන්ගේ රෝගාතුර තත්වයන්ට හා මරණයකදී මුදලින් සහ ශ්‍රමයෙන් ආධාර උපකාර කිරීම.

සාමාජික පවුල්වල අධ්‍යාපනය ලබන දරුවන්ගේ අධ්‍යාපන හා උසස් අධ්‍යාපන කටයුතු දියුණු කර ගැනීමට උදවු උපකාර කිරීම.

සාමාජික ණය අවශ්‍යතා සපුරා ලීම සඳහා ණය අංශයක් ස්ථාපිත කොට එය දියුණු කරමින් පවත්වාගෙන යාමට කටයුතු කිරීම.(මෙය ක්‍රියාත්මක කිරීමට ආරම්භ කරනුයේ සුභ සාධන අංශය ආර්ථික වශයෙන් ශක්තිමත් වු පසුවයි.)

ජාතික ආපදා අවස්ථාවලදී සාමාජිකයන්ගේ කැමැත්ත අනුව සහන සේවා

වාර්ෂික ආගමික හා සංස්කෘතික චාරිකා සංවිධානය කිරීම සඳහා ජාතික සංගමයෙන් පහසුකම් සැපයීම.

05 . සාමාජික නාමාවලිය :-

දිනෙන් දිනට යාවත් කාලීන කරන ලද සාමාජිකයන්ගේ නාමාවලියක් පවත්වාගෙන යාම ගැන සුභ සාධක ලේකම් තැන වගකිවයුතු වේ.

06 . පොත්පත් පරීක්ෂාව :-

සියලුම ගෙවීම් සුභ සාදක ලේකම් හෝ සුභ සාදක භාණ්ඩාගාරික සමග සභාපති හෝ භාණ්ඩාගාරික තැන විසින් සිදුකළ යුතු අතර විධිමත් ගෙවීම් වව්චරයක් ඒ සඳහා භාවිතා කළ යුතුය

07 . සාමාජිකත්වය :-

සමස්ත ලංකා සමෘද්ධි සංවර්ධන (බැංකු සංගම් , මහා සංගම් හා කාර්යාල) හා ක්ෂේත්‍ර නිළධාරී සංගමයේ සාමාජිකයන් මෙහි සාමාජිකත්වය ලැබීමට සුදුසුකම් ලබයි .

සම්මාන හෝ තාවකාලික සාමාජිකයන් පත්කර ගත නොහැකිය

සංගමයේ සාමාජිකත්වය ඉල්ලා සිටින සෑම කෙනෙකුම සංගමයේ නියමිත ආකෘති පත්‍රයෙන් එම ඉල්ලීම කළ යුතුය එවිට ලේකම් තැන විසින් සාමාජිකත්වය ලබාදිය හැකිය එසේ වුවද පසුව එළඹෙන ඊලග පළමු විධායක සභාවට ඉදිරිපත් කළ යුතුය එහිදී සාමාජිකයා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය බවට ඔප්පු වුවහොත් හෝ සාමාජිකත්වය සඳහා ඕනෑම කෙනෙකු කරන ඉල්ලීමක් හේතු නොදක්වා ප්‍රතික්ෂේප කිරීමේ බලය විධායක සභාවට ඇත

සංගමයේ ව්‍යවස්ථාව කඩකළ බව ඔප්පුවූ කවර සාමාජිකයකුගේ වුවද සාමාජිකත්වය තාවකාලික වශයෙන් හෝ සම්පූර්ණයෙන් තහනම් කිරීමට විධායක සභාවට බලය ඇත්තේය එහෙත් එසේ කළ විට ඒ ක්‍රියාව ස්ථිර කිරීම සඳහා හෝ ඒ පිළිබඳව වැඩි දුරටත් ක්‍රියා කිරීම සඳහා එම කරුණ සමස්ත ලංකා සමෘද්ධි සංවර්ධන (බැංකු සංගම් , මහා සංගම් හා කාර්යාල) නිළධාරී සංගමයේ ඊලග මහා සභා රැස්වීමට ඉදිරිපත් කළ යුතුය.

08. සුභ සාධන අංශ ව්‍යුහය :-

සමස්ත ලංකා සමෘද්ධි සංවර්ධන (බැංකු සංගම් , මහා සංගම් හා කාර්යාල) නිළධාරී සංගමයේ සුභසාධන කමිටුව වශයෙන් ක්‍රියාත්මක වන අතර කමිටු සාමාජිකයින් ගණන උපරිම 07 ක් වේ.

01. සමස්ත ලංකා සමෘද්ධි සංවර්ධන (බැංකු සංගම් , මහා සංගම් හා කාර්යාල) නිළධාරී සංගමයේ ගරු සභාපති , ලේකම් , භාණ්ඩාගාරික , උප සභාපති , උප ලේකම් , සුභ සාධක කමිටු ලේකම් සහ සුභසාධක භාණ්ඩාගාරික යන අයවලුන්ගෙන් සමන්විත වේ.

සාමාජික මුදල රු 75.00 යන්න

**සෑම සාමාජිකයකු විසින්ම මාස්පතා දායක මුදල් වශයෙන් රු 100.00 ක මුදලක් ගෙවිය යුතුය මේ දායක මුදල් ප්‍රමාණය වාර්ෂික මහා සභා රැස්වීමකදී හෝ විශේෂ මහා සභා රැස්වීමකදී හෝ වෙනස්කළ හැක. යනුවෙන් සංශෝදනය විය යුතුය.**

අවශ්‍යවූ විටක විශේෂ ආධාර මුදල් ඉල්ලා සිටීමට විධායක සභාවට බලය ඇත්තේය

සමිතියට ගෙවනු ලබන්නා වූ සෑම මුදලක් වෙනුවෙන්ම භාණ්ඩාගාරික තැන කුවිතාන්සියක් නිකුත්කළ යුතු වන්නේය (සාමාජික මුදල් හැර )

සමිතිය මගින් කරනුලබන සෑම ගෙවීමක්ම ගෙවීම් වව්චරයක් මගින් කළ යුතු වන්නේය

09 . දඬගැසීම් හා අහිමි කිරීම් :-

සාමාජිකයන්ට දඩ ගසනු නොලැබේ

සංගමයේ ව්‍යවස්ථාව උල්ලංගනය කරන්නා වූ හෝ මාස හයකට වඩා වැඩි කාලයක් දායක මුදල් හිඟව තබන්නා වූ හෝ සියළුම සාමාජිකයින්ට ඒ හේතුවෙන්ම සාමාජිකත්වය අහිමි වනවා මෙන්ම ඔවුනට සංගමයෙන් සැලසෙන සියළුම හිමිකම් හා සියළු වරප්‍රසාද අහිමි වන්නේය

10 . ව්‍යවස්ථා :-

මෙම ව්‍යවස්ථාවේ අඩු වැඩි කිරීම් වෙනස් කිරීම් ආදි කවර ක්‍රමයකින් හෝ සංශෝදනයක් කරන්නේනම් එසේ කළ හැක්කේ සමස්ත ලංකා සමෘද්ධි සංවර්ධන (බැංකු සංගම් , මහා සංගම් හා කාර්යාල) නිළධාරී සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීමකදී හෝ විශේෂ මහා සභා රැස්වීමකදී හෝ පැමිණ සිටින ඡන්ද බලය හිමි සාමාජිකයින්ගෙන් 2/3 කගේ අනුමත වූ යෝජනාවකින් පමණි

11. නිළධාරීන්ගේ වගකීම :-

<u>සුභ සාධක කමිටු ලේකම්වරයාගේ වගකීම.</u>

01. සමස්ත ලංකා සමෘද්ධි සංවර්ධන (බැංකු සංගම් , මහා සංගම් හා කාර්යාල) නිළධාරී සංගමයට සුභ සාධක අංශය පිළිබඳව සමස්ත තොරතුරු නිවැරදිව හා විධිමත්ව සැපයීමට සුභ සාධක කමිටු ලේකම්වරයා වගකීමට බැඳී සිටී.
02. සුභ සාධක සාමාජික නාම ලේඛණය / ලිපිගොණු ආදිය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වාගෙන යාම.
03. සෑම මසකම තුන්වන සතියේ සෙනසුරාදා දින සුභ සාධක කමිටුව අනිවාර්යයෙන්ම රැස් කිරීම.

සුභ සාධක කමිටු භාණ්ඩාගාරික වරයාගේ වගකීම.

01.ලංකා බැංකුව පිලිමතලාව ශාඛාවේ සමස්ත ලංකා සමෘද්ධි සංවර්ධන (බැංකු සංගම් , මහා සංගම් හා කාර්යාල) නිළධාරී සංගමය නමින් පවත්වාගෙන යනු ලබන ඉතිරි කිරීමේ ගිණුමට බැර කරන රු 100.00 ක මුදලින් රු 75.00 ක මුදලක් සුභ සාධක අංශ ගිණුමට බැර කරවා ගැනීම.(සෑම මසකම තුන්වන සතියේ සෙනසුරාදා දින රැස්වෙන සුභ සාධක කමිටුව විසින් මේ පිළිබඳව සොයාබලනු ඇත. )

02.සුභ සාධන අංශ සියලු ලැබීම් / ගෙවීම් ඉල්ලුම් පත්‍ර හා වවුචර් පත් ගොනු පවත්වාගෙන යාම.

03.සෑම මසකම තුන්වන සතියේ සෙනසුරාදා දින සුභ සාධන අංශ මුදල් වාර්තාවක් කමිටුවට ඉදිරිපත් කළ යුතුය.

04.වාර්ෂික ගිණුම් වාර්තා පිළියෙළ කිරීම කළ යුතුය.

සුභ සාධක කමිටු සෙසු සාමාජිකයන්ගේ වගකීම.

01.සුභ සාධන අංශයේ සමස්ත කටයුතු පිළිබඳව අධීක්ෂණය සහ විමර්ෂණය කිරීම

12 . සාමාජිකයා සතු යුතුකම් හා වගකීම් :-

01.නිවැරදිව සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රයක් පුරවා සමස්ත ලංකා සමෘද්ධි සංවර්ධන (බැංකු සංගම් , මහා සංගම් හා කාර්යාල) නිළධාරී සංගමයේ හා සුභ සාධන අංශයේ සාමාජිකත්වය ලබා ගැනීම.

02.සාමාජික මුදල් අඛණ්ඩව සංගමය හා සුභ සාධන අංශය වෙත එවීම.

03.පහත සඳහන් ගෙවීම් වලට අදාල වන යම් කිසි සිදුවීමක් සිදු වූ සැනින් අදාල ප්‍රාදේශීය සංගමයේ ලේකම් , සභාපති , භාණ්ඩාගාරික යන තිදෙනාගෙන් දෙදෙනකු නිර්දේශ කරන ලද ඉල්ලුම් පත්‍රය , ගෙවීම් වච්චරය හා ගිවිස්නාව සමග අදාල ලියකියවිලි සුභ සාධන අංශ ලේකම් වෙත යොමු කිරීම.

13 . සාමාජික හිමිකම් ( වන්දි ගෙවීම් ) :-

සුභ සාධන අංශයේ සාමාජිකත්වය ලබාගත් දින සිට මාස 06 ක් ඉක්මව ගිය පසු ප්‍රතිලාභ ලැබීමට සුදුසුකම් ලබයි.

- සාමාජික මරණයකදී — රු. 100000.00
- කලත්‍රයා හෝ අවිවාහක දරුවන්ගේ මරණයකදී — රු. 25000.00
- සාමාජිකයාගේ මව / පියා සහ නැන්දණිය / මාමණ්ඩියගේ මරණයකදී — රු. 10000.00

- දරු උපතක් සඳහා රු. 2500.00
- අවිභාහක සාමාජිකයකුගේ විවාහය සඳහා රු. 5000.00

**අධ්‍යාපන කටයුතු සඳහා**

- ශිෂ්‍යත්වය සමත් අප සාමාජිකයන්ගේ දරුවන් අතරින් දිස්ත්‍රික්කයේ වැඩිම ලකුණු ලබාගත් එක් දරුවකු සඳහා රු. 5000.00
- විශ්ව විද්‍යාල ප්‍රවේශය ලබන අප සාමාජිකයන්ගේ සෑම දරුවකු සඳහාම රු. 5000.00
- සාමාජිකයාගේ පූර්ණ අකර්මන්‍ය අවස්ථාවකදී රු.100000.00
- සාමාජිකයකුගේ / කළත්‍රයාගේ / දරුවන්ගේ / හෘදයාබාධ , වකුගඩු රෝග අවස්තාවල ප්‍රතිකාර සඳහා අවශ්‍ය වන අරමුදල් සම්පාදනයට අප සුභසාධන අංශයේ මැදිහත් වීම ලබාදීම.
- වන්දි ගෙවීම් සිදුකිරීමේදී එක් පවුලක දෙදෙනකු සාමාජිකත්වය ලබා තිබුනහොත් එක් සිදුවීමක් සඳහා ආධාර ලබා දෙනුයේ එක් අයෙකු සඳහා පමණි.මෙවැනි අවස්තාවකදී සාමාජිකයන් දෙදෙනාටම වන්දි මුදල් ගෙවිය යුතු බවට ව්‍යවස්ථා සංශෝධනයක් කරන ලදී.
- සාමාජිකයා විශ්‍රාම යන දින වන විට කිසිඳු සුභ සාධන ආධාරයක් ලබා නොගෙන සිටිය හොත් තමා සුභ සාධක අංශයට එතෙක් දායකවී ඇති මුදලින් 50 % ආපසු ලබාගත හැක.
- සුභ සාධක අංශ අරමුදල් සම්පාදනය සඳහා ක්‍රමවේද සැකසීම සුභ සාධක කමිටුව වෙත එවැනි යෝජනා ඉදිරිපත් කොට අනුමැතියෙන් පසු ක්‍රියාත්මක කිරීමේ බලය සුභ සාධක ලේකම් වෙත පැවරේ.(ලොතරැයි දිනුම් ඇදීම් / ප්‍රදර්ශණ / කැට)
- සමස්ත ලංකා සමෘද්ධි සංවර්ධන (බැංකු සංගම් , මහා සංගම් හා කාර්යාල) නිළධාරී සංගමයේ මහා සභා නිළවරණයට සමගාමීව සුභ සාධක කමිටු නිළවරණය හා ව්‍යවස්ථා සම්පාදන කටයුතු සිදු කර ගත යුතුය.

14 . අරමුදල් :-

සමිතියේ අරමුදල් ව්‍යවස්ථාවේ 3 වන ජේදයේ සඳහන් පරමාර්ථයන් මුදුන්පත් කර ගැනීම පිණිස මිස කිසිම තැනැත්තෙකුට උසාවියේ නඩු තීන්දුවකින් හෝ ආඥාවකින් ගෙවීමට නියමවන දඩයක් ගෙවීම පිණිස කවර ආකාරයකින් හෝ යෙදිය නොහැක්කේය වෙන අන් කරුණක් වෙනුවෙන්ද මුදල් වැය නොකළ යුතු වන්නේය.

සමිතියේ අරමුදල් මුදල් පහත සඳහන් (ර්) අනුජේදයෙන් යටත්ව විධායක මණ්ඩලය යෝජනා කරණු ලබන වාණිජ බැංකුවක සංගමයේ නාමයෙන් යුතු ගිණුමක තැන්පත් කළයුතු වන්නේය. සුභ සාධක භාණ්ඩාගාරික සමග ප්‍රධාන ලේකම් හෝ ප්‍රධාන සභාපති ගේ අත්සනින් මුදල් ආපසු ගැනීම කළයුතු වන්නේය.

විශාල මුදල් එකතුවක් වන්නේනම් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කළ යුතු වන්නේය.

15 . සීමා කිරීම් :-

සමිතියට අනුසාසකයෙකු පත් කර ගන්නේ නම් ඒ සඳහා සාමාජිකයෙකු පත්කර ගත යුතුය.

මෙම ව්‍යවස්තාව වෙනස් කිරීම හෝ කරුණු අඩු වැඩි කිරීම සිදු කිරීම කළ හැක්කේ මහා සභාවකදී පමණි

..................................................

ලේකම් තැනගේ /සම ලේකම්වරුන්ගේ අත්සන

2011.03.11 වන දින මහනුවර උඩරට කළා සංගම් ශාලාවේදීය.